98

# සමකාලීන 'ආනුභවික' බෞද්ධ සංකල්ප

සහ

# මැත–විට්ගන්ස්ට්නියානු දාර්ශනික ආකල්පය

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ පේරාදෙණි
මණ්ඩපයේ දර්ශනය පිළිබඳ
ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය,

ආචාර්ය ඒ.ඩී.පී. කලන්සූරිය
බී.ඒ. ගෞ. (දර්ශන)( Cey.),
එම්.ෆිල්. (දර්ශන) (Red.),
පී.එච්.ඩී. (දර්ශන)(UC)
විසිනි.

98

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ විද්‍යාලංකාර මණ්ඩපයේ
බෞද්ධ දර්ශන අංශයට, බෞද්ධ දර්ශනය
පිළිබඳ එම්.ඒ. පර්යේෂණ උපාධිය සඳහා
ඉදිරිපත් කෙරේ.

1976 – නොවැම්බර්.

# "සමකාලීන 'ආනුභවික' බෞද්ධ සංකල්ප සහ මෑත-විට්ගන්ස්ටිනියානු දාර්ශනික ආකල්පය"

## සංක්ෂේපය

0.1 බෞද්ධ ඉතිහාසයෙහි සඳහන් වන අන්දමට සිද්ධාර්ථ කුමරුන් බුඩත්වය ලැබීමෙන් පසු ඉදිරිපත් කරන ලද විමර්ශන මාර්ගයෙන් ගොඩනැඟුණු චින්තනයට බුඩාගම (බුදුන්වහන්සේගේ ආගම)[අ] යයි පුළුල්ව කියැවේ. එය දර්ශනයක් බවද නිතර අපට අසන්නට ලැබේ. සමහරු එය ආගමික දර්ශනයක් බව පවසති; තර්ක කරති.

0.2 මේ ප්‍රබන්ධයේ ක්ෂේත්‍රය මූලික කොටම සීමා කර ගැනීම මාගේ අරමුණයි. කම් ක්ෂේත්‍ර පාලනය මෙසේයි. මේ ප්‍රබන්ධයෙන් සංකල්පීය (දාර්ශනික) විග්‍රහයට භාජන වනුයේ මුල් බුඩාගම වනාහි අනුභූතිවාදයක් යයි පැවැසෙන මහාචාර්ය කේ.එන්. ජයතිලක ගේ සහ මහාචාර්ය ඩී.ජේ. කළුපහන ගේ අර්ථකථන වේ. එනම්, ජයතිලක-කළුපහන අර්ථකථනවල විකසිත වන සංකල්ප තාර්කික විග්‍රහයකට භාජන කිරීම මාගේ ප්‍රධානතම ව්‍යායාමය වනු ඇත. මුල් බුඩාගම පිළිබඳව අනුභූතිමය පදනමක් ඔස්සේ ඉදිරිපත් කොට ඇති වෙනත් අදහස්ද උචිත අවස්ථාවලදී මේ විග්‍රහයේදී සටහන් වනු ඇත.

0.3 ජයතිලක ඉතාමත් දැඩිව මත ප්‍රකාශ කරන අන්දමට, "මුල් බුඩාගම වනාහි අනුභූතිවාදයකි." මේ සංකල්පයට මූලික වී ඇත්තේ පැරණි-විට්ගන්ස්ටිනියානු දාර්ශනික සංකල්පයකි. එය නම්, සුප්‍රසිඩ වියානා කවයට ප්‍රධානවූ පැරණි-විට්ගන්ස්ටිනියානු අදහසක් වන සත්‍යෙක්ෂණ සංකල්පය වේ. කළුපහන මේ සංකල්පය පිළිබඳව සඳහනක් නොකරයි. නියුරත්, ෂ්ලික්, කානැප්, වෙයිස්මන් යනාදි වියානා කවයේ තර්කානුසාරී යථානුභූතවාදී දාර්ශනිකයින්ගේ "සත්‍යෙක්ෂණ ධර්මතාව" බිහිවූයේ පැරණි-විට්ගන්ස්ටිනියානු සත්‍යෙක්ෂණ සංකල්පය ඔස්සේය. මේ වනාහි "<u>නියති හා වැරදි-යා-නොහැකි ඥාන විභාගයක්</u>" නොව සංකල්පීය ගැටලුවලින් ගහණ වූ අර්ථය පිළිබඳව ඉදිරිපත් කරන ලද

විකල්පීය වාදයක් පමණි. බොහෝ තර්කානුසාරි යථානුභූතවාදීහු මේ ධර්මතාවේ තාර්කික ස්වභාවය පිළිබඳව විවිධ මත දරති. කිසියම් එකඟතාවක් තිබෙන බවක් ද නො පෙනේ. මෙවැනි සංකීර්ණ හා නොපැහැදිලි අර්ථය පිළිබඳ වඩිුයක් වනාහී "නියති-හා වැරදී-යා-නොහැකි ඥානවිභාගයක්" වශයෙන් පිළිගෙන අදහස් දැක්විමක් අඩංගු මුල් බුදාගම පිළිබඳ ජයතිලක-කළුපහන අර්ථකථන, සංකල්පීය වශයෙන් අබලදුබල ඒවා වෙති. මැත-විට්ගන්ස්ටයින් විසින් පැරණි-විට්ගන්ස්ටයින්ගේ අර්ථය පිළිබඳ වාදය ප්‍රතික්ෂේප කරන ලද බව සෛද්ධාන්තික ලෙසවත් පිළිගත් බවක් නො පෙනෙන මේ අනුභූතිවාදී අර්ථකථන වනාහී ප්‍රතික්ෂේප කරන ලද අර්ථය පිළිබඳ ආදර්ශයක් (අර්ථය පිළිබඳ විද්‍යාත්මක ආදර්ශය) ගුරු කොට ගත්තකි.[ආ] මේ ආදර්ශය පිළිගත යුතු බව බ'ට්‍රන්ඩ් රසල් ගේ විශ්වාසය වූ අතර, මැත-විට්ගන්ස්ටයින් මේ අදහස ප්‍රතික්ෂේපකොට අර්ථය පිළිබඳව වෙනත් ආදර්ශ ඇති බව අවධාරණය කෙළේය. මේ දාර්ශනික අදහස් විට්ගන්ස්ටයින්ගේ "පිලෝසොපිකල් ඉන්වෙස්ටිගේෂන්ස්" (1953) නමැති කෘතියෙහි පිළිබිඹු වේ. අර්ථය පිළිබඳ එකම මිනුම වනාහී "සත්‍යෙක්ෂණ ධර්මතාව" ගෙනෙන්නක් බව විට්ගන්ස්ටයින් අවධාරණය කළේ "ට්‍රැක්ටේටස්" (1922) නමැති ඔහුගේ පැරණි කෘතියෙහිය. එහි පිළිබිඹු වන විට්ගන්ස්ටයින් වනාහී "පැරණි විට්ගන්ස්ටයින්" යයි පිළිගැනෙන අතර, පූර්වෝක්තයෙහි පිළිබිඹු වන විට "මැත-විට්ගන්ස්ටයින්" යයි පිළිගැනේ. "පිලෝසොපිකල් ඉන්වෙස්ටිගේෂන්ස්" නමැති තමාගේ දෙවැනි කෘතියෙහි ප්‍රස්තාවනාවෙහි ඔහු මෙසේ සඳහන් කරයි. "අවුරුදු දහසයකට පසුව දර්ශන විෂය කෙරෙහි නැවත මිඩංගුවීමේ දී මට පිළිගැනීමට බල කරනුයේ මාගේ පළමුවැනි පොතේ බරපතළ වැරදි ඇති බව යන්නය."[ඇ]

0.4 මැත-විට්ගන්ස්ටයින් විසින් ඔහුගේම පැරණි අදහස්වල ගැබ්වෙන අර්ථය පිළිබඳ සත්‍යක්ෂණ ධර්මතාව තාර්කික දුබලබවෙන් පෙළෙන නිසා ප්‍රතික්ෂේප කරන ලදී. ඉහළ සඳහන් මුල් බුධාගම පිළිබඳ [redacted] අර්ථකථනය ඉදිරිපත් කරන ආගමික දාර්ශනිකයින් දෙදෙන සහ ඔවුන්ගේ අනුගාමිකයින් අන්ධ භක්තියෙන් මෙන් මේ ප්‍රතික්ෂේප වී ගිය අදහස් වනාහි "නියති හා වැරදි-යා-නොහැකි ඥාන විභාගයක්" බව විශ්වාස කරන බව පෙනේ. මා මෙහිදී වැඩි අවධාරණයක් දීමට බලාපොරොත්තුවන්නේ මේ සත්‍යක්ෂණ [redacted] ධර්මතාව ගෙනෙන අදහස් සැබවින්ම "නියති හා වැරදි-යා-නොහැකි ඥාන විභාගයක්" වීමට කොහෙත්ම නොහැකි බව පෙන්වීමටය. තවද, අර්ථය පිළිබඳ <u>එක්</u> මිනුම් දණ්ඩක් ගෙනෙන මේ ධර්මතාව තුළින් සියලු කියමන්වල අර්ථවත් බව සෙවීමේ නුසුදුසුකම සමකාලීන ලෝකයේ බොහෝ දාර්ශනිකයෝ පිළිගනිති. මේ අදහස් පැහැදිලිව තේරුම් ගැනීමක් ජයතිලක හා කළුපහන ගෙනෙන මුල් බුධාගම පිළිබඳ අර්ථකථනයේ දැකගැනීමට අසීරුය.

0.5 "සමකාලීන 'ආනුභවික' බෞද්ධ සංකල්ප සහ මැත-විට්ගන්ස්ටීනියානු දාර්ශනික ආකල්පය" යයි මේ ප්‍රබන්ධයට මාතෘකාව යෙදූයේ එක් වැදගත් අදහසක් ඉඟියකින් ගෙනහැරපෑමටය. එනම්, මූලික වශයෙන්ම, මැත-විට්ගන්ස්ටීනියානු දාර්ශනික ආකල්පය මාර්ගකොටගත් විට, පැරණි-විට්ගන්ස්ටීනියානු දර්ශනය තුළින් ගොඩනැගෙන ඕනෑම දර්ශනයක් අබල දුබලකම් වලින් ගහණ වන බව යන්නයි. එයට මූලික වනුයේ මැත-විට්ගන්ස්ටීනියානු ආකල්පයෙන් පැරණි-විට්ගන්ස්ටීනියානු සංකල්ප ප්‍රතික්ෂේප වන හෙයිනි. ජයතිලක, කළුපහන සහ ඔවුන්ගේ නිකායීය අනුගාමිකයින් විසින් බෞද්ධාගමික සංකල්ප වනාහි ආනුභවික මෙන්ම සත්‍යක්ෂණ

ධර්මතාව ඔස්සේ අර්ථවත්වන්නේ යයි පැවැසීම, සැබවින්ම, මෑත–විට්ගන්ස්ටීනියානු දාර්ශනික ආකල්පයෙන් ප්‍රතික්ෂේප වී යයි. ඒ බව ඔප් නැංවීමටත්, ස්ඵුට කිරීමටත් මේ ප්‍රබන්ධයේ දී උත්සාහ ගනිමි. මේ අනුව අප ප්‍රබන්ධය අරමුණු දෙකක් උදෙසා රචිතය. ඉන් මූලික අරමුණ වනුයේ ආනුභවික ස්වරූපය ගන්නා දර්ශනයක හෝ විද්‍යාවක ලක්ෂණ, මුල් බුධාගමෙහි නොමැතිබව පෑඩුලව පෙන්වීමයි. දෙවැනි අරමුණ වනාහී සතෙයක්ෂ–සන්ධාරමය ආදර්ශය නොගත්තේ වුවත්, මුල් බුධාගම අර්ථවත් දහමක් බව අවධාරණය කිරීමයි.

0.6 මාගේ මේ විමර්ශනය වනාහී එකම විමර්ශනය වශයෙන් නොව එක් විකල්පීය විමර්ශනයක් වශයෙන් පමණක් පිළිගන්නේ නම්, දර්ශන විෂයේ දියුණුව සඳහා එය ඉවහල් වේ යයි මට සිතේ.

---

අධෝලිපි (Footnotes)

අ. Majjhima Nikāya, Vol. II., Tr. I.B. Horner, Middle Length Sayings, P.T.S., London, 1954-9, p.211 "I am one of those who profess the basis of a religion............."

ආ. අර්ථය පිළිබඳ විද්‍යාත්මක ආදර්ශය දර්ශනයට හඳුන්වා දෙනු ලැබුයේ පැරණි–විට්ගන්ස්ටයින් මු ය.

ඇ. Philosophical Investigations, L. Wittgenstein, Basil Blackwell, Oxford, 1953, p. xe.